# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2331/51 – 2023 මැයි මස 12 වැනි සිකුරාදා – 2023.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/V/2015/154.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.03.25 දිනැති හා අංක 2220/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.03.18 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කෑගල්ල, බෙරගල, උපමාලි හි පදිංචි එම්. අයි. පී. කුලතිලක මිය සහ කොළඹ 05, කම්කරු මහලේකම් කාර්යාලය, 1 වන මහල හි පිහිටි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.03.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ප්‍රදානය**

**කාර්මික අධිකරණයේ දී ය**

එම්. අයි. පී. කුලතිලක
උපමාලි, බෙරගල
කෑගල්ල.

*පළමු පාර්ශ්වය.*

නඩු අංකය : A31/2021
IR/COM/04/V/2015/154.

එදිරිව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය,
1 වන මහල,කම්කරු මහලේකම් කාර්යාලය
කොළඹ 05.

*දෙවැනි පාර්ශ්වය.*

*අතර පවතින කාර්මික ආරවුල*

වර්ෂ 2023ක්වූ මාර්තු මස 03 වැනි දින දී ය.

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාලද සිල්වා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

ඉහත නම් සඳහන් පළමු සහ දෙවන පාර්ශ්වයන් අතර පවතින 2021.03.25 දිනැති අංක 2220/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත්කරන ලද, බේරුම්කරණය මගින් සමථයට පත්කිරීමට අපේක්ෂිත මෙම ආරාවුලට තුඩු දුන් කාරණය පහත පරිදි වේ.

“සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ III ශ්‍රේණියේ විධායක නිලධාරි තනතුරක සේවයකළ එම්. අයි. පී. කුලතිලක මිය ඊට පහළ ශ්‍රේණියක් වූ කනිෂ්ඨ කළමනාකාර තනතුරේ පිහිටුවීමෙන් වැටුප්, වාර්ෂික වැටුප් වර්ධක, අනෙකුත් වරප්‍රසාද හා උසස්වීම් අහිමි වීමෙන් අසාධාරණයක් සිදුවී ඇත්ද? යන්න සහ එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.”

පළමු පාර්ශ්වය විසින් 2022.03.23 දිනැති මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය මගින් ඉදිරිපත් කරනලද සාක්ෂිය සාරාංශගත කිරීමේදී පහත සඳහන් අගතීන් සහ/හෝ අසාධාරණයන් තමාහට සිදුව ඇතිබවට ප්‍රකාශකර ඇති අතර, ඒ මත සහන අයැද ඇත.

1. 2006 වර්ෂය වනවිට III වන ශ්‍රේණියේ විධායක නිලධාරී තනතුරක් දරනලද පළමු පාර්ශ්වය 2006.01.01 දින සිට බලාත්මකවූ අංක 2006/30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව මධ්‍යම කළමනාකරණ ශ්‍රේණියේ (MM-1-1) පිහිටුවිය යුතුව තිබුණ ද, පහළ ශ්‍රේණියක් වන කනිෂ්ඨ කළමනාකරණ (JM-1-1) ශ්‍රේණියේ පිහිටුවා තිබීම.

2. එපරිද්දෙන් කනිෂ්ඨ කළමනාකරණ (MM-1-1) ශ්‍රේණියට අදාළව වැටුප් ප්‍රතිශෝධනය කිරීම හේතුවෙන් පළමු පාර්ශ්වයට වැටුප් විෂමතාවකට මුහුණ පෑමට සිදුව ඇතිඅතර, ආශ්‍රිත වාර්ෂික වැටුප් වර්ධක, දීමනා හා වරප්‍රසාද අහිමිවීම.

3. ඒ අනුව, 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලැබිය යුතුව තිබූ වැටුප හා එකී 2006.01.01 දින සිට විශ්‍රාම දිවිය ඇරඹී 2015.12.26 දින තෙක් පළමු පාර්ශ්වය වෙත ගෙවා ඇති වැටුප හේතුවෙන් වූ වැටුප් විෂමතාව මත රුපියල් ලක්ෂ දොළහ (රු.1,200,000/- ක් පමණ මුදලක් අහිමිවීම,

4. ඉහත කී කාලසීමාවට අදාළව දෙවන පාර්ශ්වකාර ආයතනය විසින් වාර්ෂික ප්‍රසාද දීමනා ලෙස ගෙවිය යුතුව තිබූ රුපියල් ලක්ෂ තුන (රු.300,000/-) ක මුදලක් පළමු පාර්ශ්වයට අහිමිවීම.

5. පළමු පාර්ශ්වයට තීරු බදු රහිත වාහනයක් මිලදී ගැනීම වෙනුවෙන් ලබාගැනීමට හැකිව තිබූ රුපියල් ලක්ෂ දහය (රු.1,000,000/-) ක මුදලක් අහිමිවීම.

6. ඉහත කී චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රේණි සංශෝධනය සිදුවන විට පළමු පාර්ශ්වය සමග III වන ශ්‍රේණියේ නිලධාරීන් ලෙස සේවයේ නියුතුව සිටි පළමු පාර්ශ්වයට වඩා අඩු සේවා කාලයක් වාර්තාකර තිබූ හා අඩු අධ්‍යාපන සුදුසුකම් සහිත නිලධාරීන් කිහිපදෙනෙකු MM-1-1 ශ්‍රේණියේ පිහිටුවා තිබීම.

X1 සිට X7 දක්වා ලකුණු කරන ලද ලේඛන සමග ඉදිරිපත් කළ එකී මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය මත ඇරඹී සාක්ෂි විභාග යේදී පළමු පාර්ශ්වය හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්නවලට භාජනය කරමින් පළමු පාර්ශ්වයේ නඩුව අවසන් කරන ලදී. අනතුරුව දෙවන පාර්ශ්වය වෙනුවෙන් එකම සාක්ෂිකරු ලෙස නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමනාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්නවලට ලක්කරමින් R1 සිට R7 දක්වා ලේඛන ලකුණුකර දෙවන පාර්ශ්වයේ නඩුව අවසන්කර ඇත.

ඉහත සඳහන් එක් එක් කරුණු මෙම ආරාවුලට අදාළ සාක්ෂි විභාගයේදී කොපමණ දුරට දෙවන පාර්ශ්වය විසින් පිළිගෙන තිබේද එසේත් නැතහොත් පළමු පාර්ශ්වය විසින් ඔප්පුකර තිබේද යන්න විමසා සිටිමි. ඒ අනුව, පළමු පාර්ශ්වය විසින් අයැද ඇති කිනම් සහන ප්‍රදානයකළ හැක්කේද සහ කිනම් සහන බැහැරකළ යුත්තේද යන්න තීරණය වනු ඇත.

01. අංක 2006/30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය නිසි ශ්‍රේණියේ පිහිටුවා තිබේද?

මෙහිදී විශේෂයෙන් අවධානයට ලක්වනුයේ, පළමු පාර්ශ්වය විසින් තම මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රශ්නගත කාණ්ඩගත කිරීම මගින් තනතුරුවලට අන්තර්ග්‍රහනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනලද සාක්ෂි බොහොමයක් ඒ අයුරින්ම දෙවන පාර්ශ්වය විසින් පිළිගෙන තිබීමයි. 2006 වර්ෂය වනවිට III වන ශ්‍රේණියේ විධායක නිලධාරී තනතුරක් දරන ලද පළමු පාර්ශ්වය 2006.01.01 දින සිට බලාත්මකවූ අංක 2006/30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව මධ්‍යම කළමනාකරණ ශ්‍රේණියේ (MM-1-1) පිහිටවිය යුතුව තිබුණ ද, පහළ ශ්‍රේණියක් වන කනිෂ්ඨ කළමනාකරණ (JM-1-1) ශ්‍රේණියේ පිහිටුවීමෙන් අසාධාරණයක් සිදුව ඇද්ද යන්න දෙවන පාර්ශ්වය විසින් හබකර නොමැත.

*2022.09.12 දිනැති සටහන්*

*දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ සඳරුවනි සිංහබාහු මිය :*

> ''පළමු පාර්ශ්වය සේවයට බැඳුනු දිනය සහ ලබාඇති උසස්වීම් පිළිබඳව හා මූලික සාක්ෂියට අදාළව ඉදිරිපත්කර ඇති දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරණු හබ කිරීමක් නොකරන බව දෙවන පාර්ශ්වය වෙනුවෙන් දන්වා සිටි.''

ඊට අමතරව, දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද එකම සාක්ෂිකරු වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමනාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතාගේ මූලික ප්‍රශ්න, හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්න විමසීම් අවස්ථාවලදීද පළමු පාර්ශ්වය JM-1-1 වැටුප් කාණ්ඩයේ නොව MM-1- 1 වැටුප් කාණ්ඩයේ පිහිට විය යුතුබව පිළිගෙන ඇත. වැඩිදුරටත් එකී උද්ගත කරුණ පිළිබඳ දන්වමින් දෙවන පාර්ශ්වය විසින් ජාතික වැටුප් හා සේවක සභා කොමිෂන් සභාව වෙත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි කිහිපයක්ම යොමුකළ බව පිළිගත් බවට සාක්ෂි විශ්ලේෂණයේදී හෙළිවේ.

*2022.09.12 දිනැති සටහන්*

*සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමණාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා - මූලික සාක්ෂි*

ප්‍රඃ ඒ අනුව, මෙම III ශ්‍රේණියේ නිලධාරීන් JM-1-1 වැටුප් කාණ්ඩයේ නොව MM-1-1 වැටුප් කාණ්ඩයේ තැබීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට වගඋත්තරකාර මණ්ඩලය විසින් ජාතික වැටුප් හා සේවක සඛ්‍යා කොමිෂන් සභාව වෙත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කරලා තිබෙනවා ද මහත්මයා?

උඃ යොමු කරලා තිබෙනවා.

එකී ලිපි සහ අදාළ පිළිතුරු ලිපි, දෙවන පාර්ශ්වය විසින් R1 සිට R7 දක්වා ලකුණුකර ඇත. එකී ලේඛනවලට අමතරව, පළමු පාර්ශ්වය විසින් 2022.03.23 දිනැති මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය සමග ගොනුකර ඇති X6 සහ X7 දරන ලිපි ප්‍රකාරව පළමු පාර්ශ්වයට විෂයගත චක්‍රලේඛය ක්‍රියාවට නංවමින් අන්තර්ග්‍රහනය කිරීමේදී අගතියක් සිදුවී ඇති බව තහවුරු වේ. වඩාත් අවධානය යොමු වන්නේ මෙම කරුණ හබකර නොමැති වීමයි. එසේ හෙයින්, පිළිගැනීමක් සේ සලකා එකී ශ්‍රේණිගත කිරීම තුළ පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදුව ඇති බව තීරණය කරමි.

02. එකී චක්‍රලේඛය ප්‍රකාරව කනිෂ්ඨ කළමනාකරණ (JM-1-1) ශ්‍රේණියේ පිහිටුවීම හේතුවෙන් පළමු පාර්ශ්වයට වැටුප් විෂමතාවකට මුහුණ පෑමට සිදුව ඇත්තේද?

ඉහත සාක්ෂි සම්පින්ඩනය මත පළමු පාර්ශ්වය නිසි කළමනාකරණ ශ්‍රේණියේ පිහිටුවා නොමැති බව වැඩිබර සාක්ෂි සහ පිළිගත් කරුණු මත ඔප්පුකොට ඇති හෙයින්, පළමු පාර්ශ්වයට වැටුප් විෂමතාවක් සිදුව ඇතිබවද නිරායාසයෙන්ම තහවුරු වන අතර, දෙවන පාර්ශ්වය විසින්ද පිළිගෙන ඇත.

2022.05.27 වැනි දින දෙවන පාර්ශ්වකාර වගඋත්තරකාර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරිය විසින් ප්‍රකාශයක් කරමින් කියා සිටියේ, අංක 2006/30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව පළමු පාර්ශ්වය කනිෂ්ඨ කළමනාකරණ (JM-1-1) ශ්‍රේණියේ පිහිටුවීම හේතුවෙන් වැටුප් විෂමතාවයක් හටගෙන ඇති බවයි.

*2022.05.27 දිනැති සටහන්*

*දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ සඳරුවනි සිංහබාහු මිය ඃ*

''ස්වාමීනි, කළමනාකරණ සේවා අංක 30 චක්‍රලේඛය යටතේ කාණ්ඩගත කිරීමේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 3 ශ්‍රේණියේ නිලධාරින්ට වැටුප් විෂමතාවයක් සිදුව ඇතිබව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය පිළිගනී. පැමිණිලිකාරියද ඇතුළුව 3 ශ්‍රේණියේ නිලධාරින්ට වැටුප් විෂමතාවයක් වී ඇතිබව පිළිගනී.''

*2022.09.12 දිනැති සටහන්*

*සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමනාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා - හරස් ප්‍රශ්න*

ප්‍රඃ 2006.01.01 දිනය වනවිට මෙම කාර්මික ආරාවුලේ ඉල්ලුම්කාරිය සේවක කුලතිලක මහත්මිය ඒ වන විට උපයාගෙන තිබූ වැටුප් සහ වැටුප් වර්ධක 30/2006 චක්‍රලේඛය අනුව වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමේදී යම් ප්‍රමාණයකින් අඩු කරලා තිබුණා නේද?

උඃ වැටුප් වර්ධකයේ අගය අඩු කරලා හැබැයි ඒක ගැලපුම් දීමනාවක් ලෙස එයාට විතරක් පෞද්ගලික වන සේ දෙන්න කියලා තිබ්බා.

ප්‍රඃ 30/2006 චක්‍රලේඛය අනුව 2006.01.01 වනවිට වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඒ වන විට මෙම ඉල්ලුම්කාරිය ලබමින් සිටි වැටුප රුපියල් 4800ක වගේ ප්‍රමාණයකින් අඩුවීමක් වෙලා තිබුණා නේද?

උ: මූලික වැටුප් අඩුවීමක් සිද්ධ වූණේ නැහැ.

ප්‍ර: මම ඔබට යෝජනා කරනවා මෙම වැටුප් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේදී පළමු පාර්ශවයේ සේවිකාව ලබමින් සිටි වැටුප රුපියල් 4800ක් හෝ ඊට ආසන්න මුදලකින් අඩුවීමක් වැටුප් වර්ධකයේ අඩුවීමට අමතරවත් සිදුවුණා කියලා?

උ: මූලික වැටුපේ අඩුවීමක් වූණේ නැහැ.

සාක්ෂිකරුගේ හරස් ප්‍රශ්න අවස්ථාවේදී සාක්ෂියේ ප්‍රබලත්වය දුබල කරමින් මූලික වැටුප අඩුවූයේද යන්න පිළිබඳ යම් පරස්පරතාවක් මතුවූ නමුත්, මූලික සාක්ෂි අවස්ථාවේදී ලකුණුකළ R5 ලේඛනයේ R5අ ලෙස දැක්වෙන ස්ථානය මගින් මූලික වැටුපේ සැලකිය යුතු අඩුවක් සිදුව ඇති බව පෙන්නුම් කරයි. සාක්ෂිකරු කියන්නාවූ ගැලපුම් දීමනාවද 2012.01.01 දින සිට අත්හිටුවා ඇති බව X6 ලේඛනය ප්‍රකාරව සනාථ වේ.

2022.10.20 දිනැති සටහන්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමණාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා - වැඩිදුර හරස් ප්‍රශ්න

ප්‍ර: සරත් මහතා 2006.01.01 දිනට පෙර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් එහි III වන ශ්‍රේණියේ නිලධාරීන් විධායක ශ්‍රේණියේ නිලධාරීන් ලෙස සලකා තමයි කටයුතු කළේ?

උ: ඔව්

ප්‍ර: මේ ඒ-1 වශයෙන් ලකුණුකළ ලේඛනයේ සඳහන් කරලා තියෙනවා නේද මෙම වැටුප් ප්‍රතිශෝධනය සමගම ඒ වන විට iii වන ශ්‍රේණියේ විධායක නිලධාරීන් ලබමින් සිටි වැටුපේ වැටුප් වර්ධකයේ අඩුවීමක් සිදුවෙලා තියනවා කියලා?

උ: වැටුප් වර්ධකය 10 % ක් පමණ අඩුවෙලා තියෙනවා.

දෙවන පාර්ශ්වය විසින් ලකුණු කරනලද R1, පළමු පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න අවස්ථාවේදී ලකුණුකළ A1, පළමු පාර්ශවයේ දිවුරුම් ප්‍රකාශය සමග ලකුණුකළ X6 සහ X7 ලේඛන ප්‍රකාරවද විවිධ වගකිවයුතු පාර්ශව විසින් වැටුප් විෂමතාවක් පවතින බවට පිළිගැනීමට තුඩුදෙන කරුණු ඉදිරිපත්කර ඇත.

*2022.10.20 දිනැති සටහන්*

*සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමනාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා - වැඩිදුර හරස් ප්‍රශ්න - අධිකරණයෙන්*

ප්‍ර: යම්කිසි කෙනෙක් MM මට්ටමට එන්න බැරි වුණා කියන්නේ එයාගේ මූලික වැටුප JM මට්ටමේම තිබීමෙන් එයාට හානියක් වෙනවා නේද අපි උපකල්පනය කළොත්?

උ: එයා උසස්වීමක් ලබනකම්

ප්‍ර: එයා උසස්වීමක් ලබනකම් යන්නේ JM මට්ටමේ නේද?

උ: ඔව්

ප්‍ර: ඒ වගේම වැටුප් වර්ධකවලත් වෙනසක් තියෙනවා නේද?

උ: ඔව්

ප්‍ර: වැටුප් වර්ධකය JM වැටුප් වර්ධකයට වඩා MM තලයේ වැටුප් වර්ධකය වැඩි?

උ: ඔව්

කෙසේ නමුත්, දෙවන පාර්ශ්වය විසින් කිසිදු අවස්ථාවක වැටුප් පරතරයන් පැවතීම පිළිබඳ කරුණ හබකර නොමැත. ප්‍රමාණාත්මක හෝ ප්‍රතිශතාත්මක වශයෙන් කොපමණ දැයි තර්ක කළ ද, වැටුප් විෂමතාව පිළිගෙන ඇත. කරුණු එසේ හෙයින්, වැඩිබර සාක්ෂි මත පළමු පාර්ශ්වය විෂයගත චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම තුළින් වැටුප් විෂමතාවකට මුහුණපා ඇති බව තීරණය කරමි.

03. පළමු පාර්ශ්වයට හිමිවිය යුතුව තිබූ ආශ්‍රිත වාර්ෂික වැටුප් වර්ධක, දීමනා හා වරප්‍රසාද එකී ප්‍රශ්නගත චක්‍රලේඛය ප්‍රකාර කාණ්ඩගත කිරීම මත අහිමිවී ඇත්තේද?

ඉහත 01 සහ 02 විසඳනාවන් ද්විත්වයම වැඩිබර සාක්ෂි මත ඔප්පුවී තිබීම හේතුවෙන් පළමු පාර්ශ්වයට යම් යම් වරප්‍රසාද දීමනා ආදිය අහිමිවන බව නිසැක කරුණකි. නියමාකාරව, MM1-1 මධ්‍යම කළමනාකරණ ශ්‍රේණියේ පිහිටුවූයේ නම් පළමු පාර්ශ්වයට හිමිවිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක, වාර්ෂික ප්‍රසාද දීමනා සහ තීරු බදු රහිත වාහන බලපත්‍රය ආදිය අසාධාරණ අයුරින් තමාහට අහිමිවූ බව මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්න යන සියලු අවස්ථාවලදී ඇය විසින් අනුකූලතාවයකින් යුතුව සාක්ෂි ලබාදී ඇත. එකී සාක්ෂිගත කරුණු බොහොමයක් දෙවන පාර්ශවයේ සාක්ෂිකරු මෙහෙයවූ සාක්ෂි ප්‍රකාරවද වඩාත් ප්‍රබල සාක්ෂියක් බවට පත්ව ඇත.

*2022.08.08 දිනැති සටහන්*

*පළමු පාර්ශ්වය - නැවත ප්‍රශ්න*

ප්‍රः වරප්‍රසාද අහිමි වුණා වැටුපත් අහිමි වුණා ?

උः ඔව් ඩියුටි ෆ්‍රී පර්මිට් එක අහිමි වෙනවා වැටුපත් අහිමි වෙනවා

*2022.09.12 දිනැති සටහන්*

*සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමණාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා - මූලික සාක්ෂි*

ප්‍රः මෙම අනුමැතිය ප්‍රකාරව එවකට චක්‍රලේඛයට පෙර III ශ්‍රේණියේ නිලධාරීන්ට අහිමිවූ වරප්‍රසාද පවතිනවාද මහත්මයා?

උः ඔව්

ප්‍රः මොනවද ඒ වරප්‍රසාද?

පිः වැටුප් වර්ධකයේ අගය අඩුවෙලා තිබෙනවා, වාහන බලපත්‍රය අහිමි වෙලා තිබෙනවා.

උः වැටුප් වර්ධකයේ අගය අඩුවීම කියන එක ඔබට ප්‍රතිශතයක් විදියට කියන්න පුළුවන්ද?

පිः පළවන වැටුප් වර්ධකය එවකට රුපියල් 700ක් තිබ්බ එක හාරසිය හැත්තෑ ගණනකට අඩුවෙලා තිබෙනවා.

එසේම, තීරුබදු රහිත වාහන බලපත්‍රය සම්බන්ධයෙන් වැඩි වශයෙන් සාක්ෂි මෙහෙයවා ඇති අතර, අවසන් නිගමනය වනුයේ චක්‍රලේඛය ප්‍රකාරව MM 1-1 මධ්‍යම කළමනාකරණ ශ්‍රේණියේ පිහිටුවූයේ නම් සමස්ථ කළමනාකරණ සේවයේ අවුරුදු 12ක සේවා කාලයකින් පසු පළමු පාර්ශ්වයට එකී බලපත්‍රයක් හිමි විය යුතු බවයි. චක්‍රලේඛය ක්‍රියාත්මකවූ 2006 වර්ෂය වනවිටත් කළමනාකරණ සේවයේ සිටි පළමු පාර්ශ්වය, 2006 සිට 2015 වර්ෂයේ විශ්‍රාම යන තෙක් වසර 10ක සේවා කාලයක් සපුරා ඇත. කෙසේ නමුත්, සාක්ෂි මගින් පෙනී යන වැදගත් කාරණයක් වන්නේ පළමු පාර්ශ්වය සමග III වන ශ්‍රේණියේ නිලධාරින් ලෙස සේවයේ නියතුව සිටි පළමු පාර්ශ්වයට වඩා අඩු සේවා කාලයක් වාර්තාකර තිබූ හා අඩු අධ්‍යාපන සුදුසුකම් සහිත නිලධාරින් ඉහළ ශ්‍රේණියක පිහිටුවා තීරුබදු රහිත වාහන බලපත්‍රය ලබාදීමේදී 2006 වර්ෂයට පෙර සේවා කාලයද ඇතුළුව සපුරාලිය යුතු වසර 12ක කාලය ගණනයකර ඇති බවයි. එය සිදුකර ඇත්තේද දෙවන පාර්ශ්වයේ මැදිහත්වීමෙන් බව සනාථ වී ඇත.

04. එකී ශ්‍රේණි සංශෝධනය සිදුවන විට පළමු පාර්ශ්වය සමග III වන ශ්‍රේණියේ නිලධාරීන් ලෙස සේවයේ නියතුව සිටි පළමු පාර්ශ්වයට වඩා අඩු සේවා කාලයක් වාර්තාකර තිබූ හා අඩු අධ්‍යාපන සුදුසුකම් සහිත නිලධාරීන් ඉහළ ශ්‍රේණියක පිහිටුවා තිබේද?

මෙම කාරණයේ දී යම් යම් තර්ක විතර්ක මතු වුවද, බැලූ බැල්මට පළමු පාර්ශ්වය සමග III වන ශ්‍රේණියේ නිලධාරීන් ලෙස සේවයේ නියුතුව සිටි කිහිපදෙනෙකු MM-1-1 මට්ටමට අන්තර්ග්‍රහණයකර මෙන්ම, දෙවන පාර්ශ්වයේ මැදිහත් වීමෙන් එකී ශ්‍රේණියට අදාළව ඔවුන්ගේ වැටුප් හා සියලු දීමනා, වරප්‍රසාද ආදිය ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර ඇති බවත් සාක්ෂි විශ්ලේෂණයේදී පෙනී යයි.

*2022.09.12 දිනැති සටහන්*

*සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමනාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා - මූලික සාක්ෂි*

ප්‍රඃ 2006 අංක 30 චක්‍රලේඛයෙන් පසු මේ මහත්මියට උසස්වීමක් ලබානොදී වෙනත් පුද්ගලයින්ට MM-1-1 මට්ටමේ තනතුරු ලබාදීලා විවිධ වරප්‍රසාද ලබාගැනීමට අපි විශේෂයෙන් ඒ පුද්ගලයින්ට අවස්ථාවක් ලබාදීලා තිබෙනවාද මහත්මයා?

උඃ විශේෂයෙන් අවස්ථාවක් ලබාදීලා නැහැ.

*අධිකරණයෙන්*

ප්‍රඃ එහෙම කවර හෝ පුද්ගලයෙකුට මොනම හෝ අවස්ථාවක් ලැබුණද?

උඃ ඉල්ලුම්පත්‍ර කැඳවලා සම්මුඛ පරීක්ෂණයක් පවත්වලා ඒකෙදී තේරීපත්වුණ අයට දීලා තිබෙනවා උසස්වීම්.

ප්‍රඃ එතකොට දීලා තිබෙන්නේ MM-1-1 මධ්‍යම කළමනාකරණ මට්ටම කියන එකට කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ ඉඳන් මධ්‍යම කළමනාකරණ මට්ටමට උසස්වීමක්?

උඃ ඔව්

ප්‍රඃ ඒ ගිය නිලධාරින් මෙතුමිය එක්ක සේවය කළ එකම ශ්‍රේණියේ අය?

උඃ ඔව්

ප්‍රඃ ඒ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ මෙතුමියට වඩා කණිෂ්ඨ අයත් සිටියා ද ජ්‍යෙෂ්ඨ අයත් සිටියා ද කවලමේ ද?

උඃ කවලමේ ඉන්නේ ?

ප්‍රඃ කී දෙනෙක් විතර ඒ ආකාරයට උසස්වීම් ලැබුවා ද?

උඃ පස් හය දෙනෙක්

*2022.08.08 දිනැති සටහන්*

*පළමු පාර්ශ්වය - නැවත ප්‍රශ්න*

ප්‍රඃ ඔබගෙන් හරස් ප්‍රශ්න විමසා සිටියා ඔබ සමාන තනතුරේ සිටින ලද තවත් නිලධාරීන්හට මධ්‍යම කළමනාකරණ මට්ටමේ වැටුප් තලයන්හි පිහිටුවීමට සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල අයගේ නම් වශයෙන් එසේ කීමට හැකියාවක් තිබෙනවා ?

උඃ එම්. එම්. අනුර කුමාර, එච්. එම්. කරුණාරත්න, ඩබ්. එම්. රත්නසිරි, එච්. එච්. එස්. දිසානායක, එම්. එස්. දිසානායක, කේ. පී. සමරවීර

*2022.09.12 දිනැති සටහන්*

*සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමනාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා - හරස් ප්‍රශ්න*

ප්‍රඃ මේ ඉල්ලුම්කාරියත් තෝරාගෙන උසස්වීම් ලබපු කිහිපදෙනාත් එකම ශ්‍රේණියේ ඉන්නේ ?

උ: ඔව්

ප්‍ර: ඔය ආකාරයට යම් පිරිසක් තෝරාගන්නවා නේද ? මගේ ප්‍රශ්නය තමයි ඒ තෝරාගත් අය සහ මේ ඉල්ලුම්කාරිය අතර වෙනස මෙකක් ද කියලා ?

උ: ඒ අය අපි ඉල්ලුම් කරන අවස්ථාව වන විට MM මට්ටම උසස්වීම් ලබලා තිබ්බේ. එතන ඉඳලා තමයි ඊළඟට කාලය ගත්තේ.

ප්‍ර: හැබැයි කනිෂ්ඨ කළමනාකරණයෙනුත් කාලයක් එකතුකර ගත්තා ?

උ: ඔව්. එක ලියුමක් යැව්වා 2006.01.01 සිට විධායක ශ්‍රේණියේ සිටිය නිලධාරීන් සහ එකෙන් පස්සේ කවදාහරි දවසක MM වැටුප් කාණ්ඩයට පත්වෙලා හිටිය කාලය ගත්තා එක කාණ්ඩයකට. දෙවෙනි එක ගත්තා අපි 2006.01.01 ට පෙර iii වන ශ්‍රේණියේ සිටිය නමුත් තවමත් iii ශ්‍රේණියේ ඉන්න උසස්වීම් නොලැබූ.

ප්‍ර: හැබැයි ඔබ ප්‍රකාශ කරන ආකාරයට ඒ සුදුසුකම් මේ ඉල්ලුම්කාරියටත් තිබෙනවා නේද ?

උ: ඔව් අපි දෙවනුවට කරන ලද ඉල්ලීම එහෙන් ප්‍රතික්ෂේප කළා.

ප්‍ර: පළවෙනි කණ්ඩායම සාර්ථක වුණා.

උ: ඔව්

පළවෙනි කණ්ඩායමට පළමු පාර්ශ්වය ඇතුළත් නොවීම ද බැලූ බැල්මට අසාධාරණයකි.

*2022.10.20 දිනැති සටහන්*

*සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කළමනාකාර (පරිපාලන හා මානව සම්පත්) බාලගේ සරත් මහතා - වැඩිදුර හරස් ප්‍රශ්න (අධිකරණයෙන්)*

ප්‍ර: උසස්වීම් ලබාදීම සම්බන්ධයෙන් ඒක ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් පිටත බලධාරියෙක් නෙවේ. අධ්‍යක්ෂ මණ්ඩලය නේද තීරණය කරන්නේ ?

උ: ඔව්

පළමු පාර්ශ්වය පැමිණිලි කළ පරිදි තමා සමග එකම ශ්‍රේණියේ සේවය කළ යම් පුද්ගලයන් ඉහළ ශ්‍රේණියක පිහිටුවීම දෙවන පාර්ශවීය සාක්ෂිකරු විසින් ද පිළිගෙන ඇත. එසේ උසස්වීම් ලබාදීමේ දී චක්‍රලේඛගත අවශ්‍යතාව සපුරාලීම සඳහා 2006 වර්ෂයට පෙර සේවා කාලය ද ඇතුළත් වන පරිදි සේවා කාලය ගණනයකර ඇත. ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ද ලබාගෙන ඇත. ඒ අනුව බැලීමේ දී, දෙවන පාර්ශවයේ අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි යම් කාරණා සම්බන්ධව විශේෂ මැදිහත්වීමක් සිදුකර අවශ්‍ය පියවර ගැනීමට හැකියාව තිබිය දී සහ බැලූ බැල්මට පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදුව ඇති බව පෙනී යනවිට එකී අසාධාරණය මධ්‍යයේ ඇය වසර 10ක කාලය සේවයකර විශ්‍රාම යන තෙක් සුදුසු පියවර කාර්යක්ෂමව නොගැනීම පිළිබඳ මතයක් ගොඩනැගී ඇත.

සමස්ථයක් ලෙස ගත් කළ, පළමු පාර්ශ්වය ආකාර දෙකකින් අසාධාරණයට ලක්ව ඇත. එක් අතකින් පළමු පාර්ශ්වය නිසි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය නොකිරීම හේතුවෙන් සහ අනෙක් අතට විෂයගත චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේ දී පළමු පාර්ශ්වයට වෙනස් කොට සලකමින් සම ශ්‍රේණියේ සමාන තනතුරුවල සිටි පිරිස් නියමිත ඉහළ ශ්‍රේණියට අදාළ තනතුරුවල පිහිටුවීමෙන් අසාධාරණයට ලක්ව ඇත.

*Ramupillai vs. Minister of Public Administration, Provincial Councils and Home affairs and others 1991 (1) Sri. L.R. at 44* දරන නඩුවේ දී රණසිංහ අගවිනිසුරුතුමන් විසින් නඩු තීන්දු ගණනාවක් උපුටා දක්වමින්, සේවක අයිතීන් අභිමුව නීතිය පසිඳලීම (equality before law) සහ නීතියේ රැකවරණය (equal protection of law) යන සංකල්ප මනාව විග්‍රහ කර ඇත. ඒ අනුව, *State of Kerala vs. Thomas and others IR 1976 SC 490, Probhudas Morarjee vs. Union of India AIR 1966 SC 1044, Railway Express Agency vs. New York (1949) 336 US 100, S.C. Perera vs. University Grants Commission S.C. Application No. 88 of 1980* යන නඩු තීන්දු ගෙනහැර දක්වමින් තීරණයකර ඇත්තේ, සමාන සුදුසුකම් හා සමාන අවස්ථා හිමි තැනැත්තන්ට වෙනස් කොට සැලකීම සහ අසාධාරණ වර්ගීකරණයන් සිදුකිරීම සිදුනොකළ යුතු බවයි. එහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රකාර සමානාත්මතාව යන්න විමසා ඇත.

*"The provisions of Article 12(1) and (2) bring within their reach equality of opportunity for employment as well and that such guarantee of equality applies not only in the matter of selection for employment, but also at the stage of selection for promotion."*

තවද, රාජ්‍ය සේවයේ සමාන අවස්ථා සැලසීම සේවයට තෝරා ගැනීමේ දී මෙන්ම යම් තනතුරුවලට උසස් කිරීමේ දී ද තහවුරු වියයුතු බව එකී නඩුවේ දී ම Seervai, Constitutional Law of India, Volume 1, 3rd Edition හි 423 වන පිටුව උපුටා දක්වමින් තීරණය කර ඇත.

*"Equality of opportunity in matters of public employment cannot be confined to the initial matters prior to the act of employment, but include other matters relating to employment, such as promotion to selected posts."*

මේ අනුව, සියලු සාක්ෂි හා පිළිගැනීම් විශ්ලේෂණය කළ පසු, පළමු පාර්ශ්වය ප්‍රශ්නගත අංක 2006/30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, පහළ ශ්‍රේණියක් වන කණිෂ්ඨ කළමනාකරණ (JM-1-1) ශ්‍රේණියේ පිහිටුවීම අසාධාරණ බවත්, එකී අසාධාරණය හේතුවෙන් පළමු පාර්ශ්වයට අදාළ වැටුප් වර්ධක, දීමනා සහ වරප්‍රසාද සියල්ල අහිමිවී ඇති බවත් තීරණය කරමි. ඊට අමතරව පළමු පාර්ශ්වය සේවය කළ ශ්‍රේණියේම සිටි කිහිපදෙනෙක් පමණක් දෙවන පාර්ශවයේ මැදිහත් වීමෙන් යුතුව සමාන්තර ශ්‍රේණිය (MM-1-1) ට අන්තර්ග්‍රහණය කිරීම තුළින් පළමු පාර්ශ්වයට වෙනස්කොට සලකමින් අසාධාරණ ක්‍රියාවක් සිදුකර ඇත. පළමු පාර්ශ්වය මේ වන විට විශ්‍රාම ගොස් සිටිය ද, මෙම ආරවුල සම්බන්ධ කාරණය ඇය සේවය කරන ලද කාලය තුළ පැන නැගි කරුණක් නිසාවෙන් ද, කාර්මික ආරවුල් පනතේ 48 වගන්තියෙන් අර්ථ දක්වෙන සේවකයා යනු සේවයේ නියුතු මෙන්ම සේවය අවසන් කරන ලද පුද්ගලයෙකු වන බැවින් මෙම කාරණය සාධාරණ හා යුක්තිය විමසා බැලීමකින් තොරව බැහැර කළ නොහැක.

බේරුම්කරු වශයෙන් මාගේ කාර්යභාරය වනුයේ පරීක්ෂණයේ ස්වභාවය, ආරවුල ඉදිරිපත් කරනු ලබන අවස්ථාව වන විට පාර්ශ්වයන්ගේ අයිතීන් හා වගකීම් සහ අයැද ඇති සහන මත සාධාරණ සහ යුක්තිසහගත (*just and equitable*) ප්‍රදානයක් ලබා දීමයි. එවැනි සාධාරණ සහ යුක්තිසහගත (*just and equitable*) ප්‍රදානයක් ලබාදීම සඳහා *Thirunavakarasu v. Siriwardena (1981) 1 SLR 185 at 191* නඩුව ප්‍රකාර බලතල ක්‍රියාවට නංවනු ඇත.

*"An industrial arbitrator has much wider powers both as regards scope of the inquiry and the kind of orders he can make than an arbitrator in civil law. In short, we can fairly say that arbitration under the industrial law intended to be even more liberal, informal and flexible than the commercial arbitration."*

පළමු පාර්ශ්වයට හිමිවිය යුතු හිඟ වැටුප්, වාර්ෂික ප්‍රසාද දීමනා සහ තීරු බදු රහිත වාහන බලපත්‍රයේ වටිනාකම් පිළිබඳ දෙවන පාර්ශ්වය විසින් හබකර නොමැති අතර එකී තත්ත්වය පිළිගෙන ඇත.

ඒ අනුව, 2006 වර්ෂය වන විට III වන ශ්‍රේණියේ විධායක නිලධාරි තනතුරක් දරන ලද පළමු පාර්ශ්වය 2006.01.01 දින සිට බලාත්මක වූ අංක 2006/30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව මධ්‍යම කළමනාකරණ ශ්‍රේණියේ (MM-1-1) පිහිටුවා, 2006.01.01 දින සිට, විශ්‍රාම දිවිය ඇරඹී 2015.12.26 දින තෙක් ලැබිය යුතු මතු සඳහන් හිඟ වැටුප් ප්‍රසාද දීමනා සහ තීරු බදු රහිත වාහනයක් මිළ දී ගැනීම වෙනුවෙන් නියමිත මුදල හිමිවිය යුතු බව තීරණය කරමි.

(අ) 2006-01-01 වැනි දින සිට 2015-12-26 දින තෙක් ලැබිය යුතුව තිබූ වැටුප සහ ගෙවා ඇති වැටුප අතර පරතරය ලෙස පළමු පාර්ශ්වයට රුපියල් ලක්ෂ දොළහක (රු. 1,200,000/-) මුදලක් දෙවන පාර්ශ්වය විසින් ගෙවිය යුතුය,

(ආ) 2006-01-01 සිට 2015-12-26 දින තෙක් පළමු පාර්ශ්වයට ලැබිය යුතු වාර්ෂික ප්‍රසාද දීමනාවල එකතුව ලෙස රුපියල් ලක්ෂ තුනක (රු. 300,000/-) මුදලක් දෙවන පාර්ශ්වය වෙතින් ගෙවිය යුතුය,

(ඇ) තීරුබදු රහිත වාහනයක් මිළ දී ගැනීම සඳහා හිමිවිය යුතු රුපියල් ලක්ෂ දහයක (රු. 1,000,000/-) මුදල දෙවන පාර්ශ්වය විසින් ගෙවිය යුතුය, එකී සම්පූර්ණ මුදල එනම් රුපියල් ලක්ෂ විසිපහක (රු. 2,500,000/-) මුදලක්,

දෙවන පාර්ශවකාර සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් සහකාර කම්කරු කොමසාරිස්, නැගෙනහිර-කොළඹ වෙත මෙම ප්‍රදානය ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීමෙන් මසක් ඇතුළත තැන්පත් කළ යුතු බවත් නියෝග කරමි.

(බණ්ඩාර සෙනරත්)
බේරුම්කරු.

EOG 05 - 0077

මගේ අංකය: IR/COM/05/2018/90.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.08.26 දිනැති හා අංක 2138/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.08.13 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, ඇල්හේන පාර, ජයසුන්දර පෙදෙස, අංක 10/21 ඒ හි පිහිටි සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය (එච්. පී. සුනීතා පද්මසීලී මිය වෙනුවෙන්) සහ කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.01.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය: A /92/2019.
යොමු අංකය: IR/COM /05/2018/90.

සමස්ථ ලංකා මෝටර් සේවක සමිතිය,
අංක 10/21ඒ, ජයසුන්දර පෙදෙස,
ඇල්හේන පාර,
මහරගම.
(එච්. පී. සුනීතා පද්මසීලි මිය වෙනුවෙන්)

*පළමු පාර්ශ්වය*

එදිරිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන

වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019.08.13 බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කොළඹ ප්‍රාදේශීය පාලන කාර්යාලයේ යතුරු ලිපිකාරිණියක ලෙස සේවය කරන එච්. පී. සුනීතා පද්මසීලි මහත්මියට විරුද්ධව පැවති විනය පරීක්ෂණයෙන් අනතුරුව පසු වැටුප් රහිතව මාස 03ක් සේවය තහනම් කර ස්ථානමාරු කිරීම (වෙනත් සේවා ස්ථානයකට අනුයුක්ත කිරීම) මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ. ''

පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය නඩු තමන්ගේ දේශන සහ ප්‍රති ප්‍රකාශන ඉදිරිපත් කර එක් එක් පාර්ශ්වයන් අතර හුවමාරු කරගත් පසු 2020.03.02 වැනි දින විභාගය ආරම්භ කරන ලදී.

මූලික සාක්ෂිවලදී ඉල්ලුම්කාරිය විනය අංශයේ සේවය කර ඇත. ඇය තම පත්වීම් ලිපියේ 13 වන ඡේදයට විත්තියෙන් හරස් ප්‍රශ්න ඇසීමෙන් අවධානය යොමු කර සිටී. එහි සඳහන් වන විනය ව්‍යවස්ථා මාලාවට අනුව කටයුතු කිරීමට බැඳී සිටින බව පිළිගනී. සිය කැමැත්තෙන් විශ්‍රාම යාමට ඉල්ලුම් කරන්නන් 2016.06.30 ට පෙර ඉල්ලුම් කළ යුතු බවත් එය නැවත ඉල්ලා අස්කර ගත නොහැකි බවත් 2016/01 දරන චක්‍රලේඛනයේ සඳහන් බව පිළිගනී. ඉල්ලුම්කාරිය තම ඉල්ලුම්පත ආපසු භාරගත් බවට හා තම අත්සන යොදා එම ඉල්ලුම්පත භාරගත් බව හරස් ප්‍රශ්නවලදී පිළිගෙන ඇත. 2020.08.01 දින හරස් ප්‍රශ්න අසන විට දීර්ඝ සේවයක් ඇති යතුරුලියන ලිපිකාරිණියක් දෙන පිළිතුරු ලෙස නොව කුඩා දරුවකු ලෙස පිළිතුරු දෙන බවක් පෙනෙන්නට තිබුණි. (R4) ලේඛනයේ අත්සන් කර ලබාගත් ලේඛනය චක්‍රලේඛනය දන්නා ඕනෑම අයෙකු නිහතමානිව හා අවංකව එය භාරගත් බව පිළිනොගෙන දුන් නිසා වැනි ප්‍රකාශ කිරීම අවංක ප්‍රකාශ නොවේ. ඉල්ලුම්කාරිය හරස් ප්‍රශ්න සඳහා දුන් සාක්ෂි අනුව වරද ඉහළ නිලධාරීන් මත පැටවීමට ද තැත් කළ බව කිව හැකිය. (R6A) ලේඛනයෙන් පිටු 540 යටතේ සටහන් තබා ඇති පැහැදිලිය. ''R7'' ලේඛනය පරීක්ෂා කළ විට එහි ඉල්ලුම්කාරිය තම ප්‍රකාශය තුළින් විශ්‍රාම ගැනීමේ ඉල්ලුම්පත ගත් බවත් එය ලේඛනවල කපා දැමූ බවත් පිළිගෙන ඇත.

පරීක්ෂණයේ දී තමා විසින් ඉහළ නිලධාරීන්ගේ අවසරය මත ඉල්ලුම්පත ආපසු ගත් බව හරස් ප්‍රශ්නවලදී පිළිතුරු දුන්නත් එය සනාථ කිරීමට එම කිසිම නිලධාරියෙකු කැඳවා නැත. එසේ සාක්ෂිකරුවන් නොකැඳවීම තම නියෝජිත මහතා පිට පවරා ඇත. තමා නිර්දෝෂී බව ඔප්පු කිරීමට එය තම නියෝජිතයා මගින් කිරීමේ හැකියාව තිබුණි. ඉල්ලුම්කාරියට විනය පරීක්ෂණයේ දී සාක්ෂිකරුවන් කැඳවීමට නොහැකි වූවත් බේරුම්කරණයේ දී සාක්ෂිකරුවන් කැඳවීමට හැකියාව තිබුණත් එසේ කළේ ද නැත. ඉල්ලුම්කාරිය තම මූලික පරීක්ෂණය හා අභියාචනය සාධාරණව ඉටු නොකළ බව පවසා බේරුම්කරණයට පැමිණුනත් බේරුම්කරණයේ දී හෝ තමාට සිදු වූවා යැයි කියන අසාධාරණය පෙන්වා දීමට උත්සහ නොකළ බව පෙනේ. ''හරස් ප්‍රශ්න මගින් විත්තියේ නීතිඥ මහත්මිය විසින් සැමවිටම මූලික පරීක්ෂණය හා අභියාචනයේ දී අසාධාරණයක් සිදුවී නැති බව සනාථ කර ඇත.''

විත්ති පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් බෙත්මගේ සරත් පෙරේරා මහතා දිවුරුම් පෙත්සම මගින් හා ඔහුගෙන් ඉල්ලුම්කාරියගේ නියෝජිතයා අසන ලද හරස් ප්‍රශ්නවලට දෙන ලද පිළිතුරුවලින් ද පැහැදිලි වන්නේ ඉල්ලුම්කාරිය මාණ්ඩලික ලේඛන වෙනස් කිරීම මගින් විෂමාචාර ක්‍රියාවක් කර ඇති බවයි.

විත්තිය වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද දෙවන සාක්ෂිකාරිය වන ඩබ්. ඒ. නිලූපා ගයානි 2022.05.24 දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් සහ වැඩිදුර චාවිකව ද සාක්ෂි ලබාදෙමින් කියා සිටියේ ප්‍රාදේශීය කළමනාකාර ශීලා මියට දැන්වූ විට, ''RM'' මහත්මයාට කියල නම් දෙන්න. හැබැයි පොතේ ලියලා අත්සන් අරගෙන දෙන්න'' කියා පැවසූ බව කියා සිටින ලදී. එසේම එම ඉල්ලුම්පත්‍රය 2016.07.04 දින ශීලා මහත්මියට භාරදුන්න ''ඉල්ලුම්පත්‍රයේ සේවා කාලය සම්බන්ධව ගැටළුවක් පවතින බවත් ඒක බලාගන්න ඕන'' කියා ආපසු ලබාගන්නත් නැවත භාර දී නැති බව කියා සිටී. ඇයගේ දිවුරුම් පෙත්සම අවසානයේ කියා සිටින්නේ පත්මසීලි මහත්මිය ඇගේ ඉල්ලුම්පත්‍ර ඉවත් කර ගැනීමට වංචා සහගතව කටයුතු කර ඇති බවයි.

විත්තිය වෙනුවෙන් වටාපත උස්වත්තගේ වසන්ත සිරිසේන මහතා සාක්ෂියට කැඳවන ලදී. විමර්ශනයක් කරන මෙන් ප්‍රධාන මානව සම්පත් කළමනාකරු සාක්ෂි දෙමින් මගේ ආසන්න ප්‍රධානියා වන ආරක්ෂක සහ විමර්ශනයට නියෝග කළ පසු ඔහු මා වෙත විමර්ශනය පවරනවා. ඒ අනුව මා විමර්ශනය කරනු ලැබුවා. සභාපති, ප්‍රධාන ආරක්ෂක විමර්ශනය වෙත නියෝග කළ පසු ප්‍රධාන ආරක්ෂක කළමනාකාර

වෙත වාචිකව හෝ ලිඛිතව නියෝග කළ හැකි බවත් කියා සිටී. විමර්ශනයේ අවසාන නිගමනය කුමක්දැයි ඇසූ විට යතුරු ලිපිකාරිණී සුනීතා පත්මසීලි මහත්මිය විමර්ශනයට අනුව ශ්‍රී ලංගම කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ 8 ශ්‍රේණියේ යතුරු ලිපිකාරිණී සුනීතා පද්මසීලි මහත්මිය විසින් අසත්‍ය ප්‍රකාශ කරමින් විධායක නිලධාරිනියක් සහ අවශේෂ නිලධාරින් නොමග යැවීමට කටයුතු කිරීම මණ්ඩල ලේඛන සටහන් කූඨ ලෙස වංචනික ලෙස තමන්ට වාසිදායක වන ආකාරයෙන් වෙනස් කිරීම මකා දැමීම ශ්‍රී ලංගම ප්‍රධාන මානව සම්පත් කළමනාකාරතැන විසින් නිකුත් කරන ලද 2016 අංක 1 දරන චක්‍රලේඛනයට පටහැනිව ක්‍රියා කිරීම එම චක්‍රලේඛනයට අනුව ඉදිරිපත් කරන ලද සිය කැමැත්තෙන් විශ්‍රාම ගැනීමේ අයදුම්පත්‍රය වංචනික ලෙස ලබා ගෙන අස්ථානගත කිරීම විනාශ කිරීම යන බරපතල විෂමාචාරය සිදුකොට ඇති බව කියා සිටී.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් බර්නගේ ගීතා කුමාරි මිය සාක්ෂියට කැඳවන ලදී. මා මුදල් අංශයට ලිපි භාරදෙන පොතේ 537 සිට 540 ට වෙනකල් මගේ අත්අකුරෙන් ලියලා මුදල් අංශයේ නිරූපමා මිස්ට බාරදෙනවා. සුනීතා මහත්මිය තම ඉල්ලුම්පත භාරගෙන ඇති බව හත්වන මස 18 වැනි දින පොත පෙරලා බලද්දී තනි ඉරකින් එය කපා අත්සන් කර ඇති බව දැනගන්නට ලැබුණ බව කියා සිටින ලදී. හා "R (6)" හා "R 6A" ලෙස ලකුණු කළ ලේඛන ටිපෙක්ස් කරලා තිබෙනු දුටු බවත් ඒ පිළිබඳ සුනීතා මිස්ට දැන්වූ බවත් ඇය එය නොදන්නා බවත් කියා සිටිබව සාක්ෂි දෙන ලදී.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් 5 වන සාක්ෂිකාරිය වන කුකුලේ කන්කානම්ගේ ඉෂානි මධුවන්ති කැඳවන ලදී. ඉල්ලුම්කාරියගේ අයදුම් කළ බවත් තැපැල් අංශය හරහා මුදල් අංශයට යවන බවත් සුනීතා මහත්මියගේ ඉල්ලුම්පත නොතිබූ බවත් කියා සිටී. ඒ පිළිබඳව පරිපාලන නිලධාරි පත්මකුමාර මහතාට දැනුම් දුන් බවත් කියා සිටී.

ඉල්ලුම්කාරියගේ සාක්ෂි සහ ඇය මූලික පරීක්ෂණවලදී දෙන ලද ප්‍රකාශ සහ අනිකුත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සහ ප්‍රකාශන ගැන ද දිවුරුම් ප්‍රකාශයෙන් සහ අදාළ ලේඛන පරීක්ෂා කිරීමේ දී ඉල්ලුම්කාරිය චක්‍රලේඛනවලට පිටින් වංචාසහගත අසත්‍ය ප්‍රකාශ කරමින් තම වාසියට ලේඛන වෙනස් කරමින් වංචනිකව අයදුම්පත්‍රය නැවත ලබාගෙන අස්ථානගත කර ඇති බව පෙනේ. එය ආයතනයේ විනය පටිපාටියට අනුව බරපතල විෂමාචාරයක් ලෙස පෙන්වා ඇත.

ඉහත සඳහන් කරුණු අනුව ඉල්ලුම්කාරියට දෙන ලද වැටුප් රහිත මාස තුනක සේවය තහනම් කර ස්ථානමාරු කිරීම් තුළින් අසාධාරණයක් සිදුවී නොමැති බවත් ප්‍රකාශ කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම.
බේරුම්කරු.

2023 ජනවාරි මස 04 වැනි දින.

EOG 05 - 0078

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.